# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2163/22 - 2020 පෙබරවාරි මස 19 වැනි බදාදා - 2020.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78 (XV) (A)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

21 වන වගන්තිය සහ 139 වන වගන්තිය සමග කියවිය යුතු 27 (1) වන වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය ආචාර්ය බන්දුල ගුණවර්ධන වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින් එකී පනතේ 139 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව සහ එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලැබිය යුතු වූ ශ්‍රී ලංකාවේ මොරටුව විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වමින් (2017 සැප්තැම්බර් මස 21 වැනි දින අංක 2037/18 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත) 2006 නොවැම්බර් මස 03 වැනි දින අංක 1469/38 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන ''ව්‍යාපාර පීඨය'' යන අයිතමයට සහ ඊට අනුරූපව එහි II වන තීරයේ දැක්වෙන සටහන්වලට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් එකී නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

| *I වන තීරය* | *II වන තීරය* |
|---|---|
| ''වෛද්‍ය පීඨය | 1. ව්‍යවච්ඡේද අධ්‍යයන අංශය (පූර්ණ සහ සායනික ව්‍යවච්ඡේද) |
| | 2. ජෛව රසායන විද්‍යා සහ සායනික රසායන විද්‍යා අධ්‍යයන අංශය |
| | 3. භෞතවේද අධ්‍යයන අංශය |
| | 4. භිෂග්වේද අධ්‍යයන අංශය |
| | 5. ක්ෂුද්‍රජීව විද්‍යා සහ පරපෝෂවේද අධ්‍යයන අංශය |
| | 6. ප්‍රජා වෛද්‍ය විද්‍යා සහ පවුල් වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | 7. ව්‍යාධිවේද සහ අධිකරණ වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශය |
| | 8. වෛද්‍ය විද්‍යා සහ මානසික සෞඛ්‍ය (මනෝචිකිත්සා) අධ්‍යයන අංශය |
| | 9. ශල්‍යවෛද්‍ය සහ නිර්වින්දන අධ්‍යයන අංශය |
| | 10. ප්‍රසව සහ නාරිවේදී අධ්‍යයන අංශය |
| | 11. ළමා රෝග සහ නවජන්මවේද අධ්‍යයන අංශය |
| | 12. වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය |
| | 13. වෛද්‍ය තාක්ෂණ අධ්‍යයන අංශය''. |

ආචාර්ය බන්දුල ගුණවර්ධන,
උසස් අධ්‍යාපන, තාක්ෂණ සහ නවෝත්පාදන අමාත්‍ය.

2020 පෙබරවාරි මස 18 වැනි දින,
කොළඹ දී ය.

03 - 132

1A - PG 4884 — 518 (2020/02)  ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*